**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 01 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 30 දින සභාවේ නගරාධිපතිවරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිදහස් දුම්රිය බලපත්‍ර වෙනුවෙන් ඉකුත් වර්ෂයේ දී කලයුතු ණය හිමි වෙන්කිරීම් රු. 439,145 ක් අඩුවෙන් වෙන්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ආදායම් ලේඛන අනුව 2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගලිබවුසර් සේවා ආදායම රු.297,921ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල එය රු.39,000 ක් ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් 2015 වර්ෂයේ ගලිබවුසර් සේවා ආදායම හා ගලිබවුසර් සේවා ණය ගැති ශේෂය රු.258,921 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) පුද්ගලික ආයතනයකින් 2012 සැප්තැම්බර් 13 දින පරිත්‍යාග වශයෙන් ලැබුණු ඩිමෝ බට්ටා රථ දෙක 2015 ඔක්තෝබර් 12 දින සභාවට පවරාගෙන ඇතත් එහි වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.අදාල කාලපරිච්ඡේදය සඳහා ක්ෂය කිරීම් ද සිදු කර නොතිබුණි.

(ඈ) (i) 2013 ජනවාරි 29 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාව වෙත ලබා දී තිබුණු වටිනාකම රු. 3,178,227 ක් වන කැබ්රථය සඳහා 2014 අගෝස්තු 20 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ (බස්නාහිර පළාත) ලිපියෙහි උපදෙස් පරිදි කැබ්රථයේ ගෙවිය යුතු වාරික 4 හි වටිනාකම වූ රු.353,136 ක් ගෙවිය යුතු ලෙස ගිණුම් ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අයකර ගත හැකි උපයෝගි සේවා ගිණුම හා පළාත් සභා ණය ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ii) එමෙන්ම ඉහත ලිපියේ උපදෙස් පරිදි 2015 දෙසැම්බර් 31 දින තෙක් වාරික වශයෙන් ගෙවා ඇති රු. 2,825,091 ක් කැබ්රථයේ වටිනාකම ලෙස ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෝටර් රථ ගිණුම හා ප්‍රාග්ධන යෙදූමට ආදායමෙන් දායක වීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වෙනුවෙන් ලැබිය යුතු විනෝද බදු රු.289,234 ක් ගිණුම් ගත නොකිරිම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම හා විනෝද බදු ණය ගැති ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.366,504,545 ක් වු ගිණුම් විෂයයන් 12 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමඟ සැසදීමේදී මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් රු. 476,728 ක් ද, වැඩියෙන් දැක්වීම් රු.3,472,142 ක් ද විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් අනුව ලැබිය යුතු මිශ්‍ර ආදායම් හිඟ ශේෂය රු. 151,832,233 ක් වුවත් මූල්‍ය ප්‍රකාශන වල එය රු. 147,774,426 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල රු. 4,057,807 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඉකුත් වර්ෂයේ ද මෙම වෙනස මූල්‍ය ප්‍රකාශන වල පවතින බව විගණන වාර්තාව මගින් පෙන්වා දී තිබුණ ද එය නිවැරදි කිරීමට අදාල පියවර ගෙන නොතිබුණි.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට වාහන, ආපදා, උත්සව හා විශේෂ යන ණයවර්ගවලින් සමන්විත සේවක ණය ශේෂය රු. 3,485,636 ක් වූ අතර මෙම ණය ශේෂය වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ අයනොවී පැවතුණි.

(ආ) 2013, 2014 හා 2015 යන වර්ෂවලට ආදාලව හිඟ සභික දීමනා මුදල වූ රු.7,021,000 ක් 2016 අප්‍රේල් 29 දින වන විටත් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඇ) ලැබිය යුතු මිශ්‍ර ආදායම් ශේෂ තුල 2014 වර්ෂයට පෙර සිට පැවත එන මස් කඩකුලී හිඟ ශේෂය වු රු.2,356,017 ක් හඳුනා ගෙන අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.10,854,144 ක් සඳහා අදාල ගිවිසුම්, ශේෂ සනාථන ලිපි, සභාව විසින් යවන ලද සිහිකැඳවීම් වලට පිළිතුරු යනාදි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවීය.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.312,450,626 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 297,508,403 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ,

(i) 177(1) ට අනුව රැස්කරගන්නා ලද ආදායම් දිනපතා හෝ හැකිතාක් කලින් හෝ බැංකුගත කළ යුතු වුවත් රත්මලාන දිනපතා වෙළඳපොළෙහි දෛනිකව රැස්කරගනු ලැබූ රු. 288,240 ක පොළ ගාස්තු එම නිලධාරියා විසින් මාසයකට වරක් සභාවට භාරදී තිබුණි.

(ii) 188 (2) ට අනුව 2015 දෙසැම්බර් 31 දිනට තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ රු. 48,683 ක චෙක්පත් 5 ක් හා මුදල් ඇණවුම් 2 ක් සම්බන්ධව විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) 371(5) ට අනුව අත්තිකාරම් ලබාගත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හෝ එදිනට පෙර එම අත්තිකාරම් නිරවුල් කලයුතු වුවද අත්තිකාරම් ලේඛනය අනුව නොපියවන ලද එකතුව රු.1,129,663 ක අත්තිකාරම් ශේෂයක් පැවතුණි.

(iv) 396 (ඇ) ට අනුව 2015 දෙසැම්බර් 31 දිනට මාස 06 ඉක්මවූ එකතුව රු.813,945 ක් වූ නිකුත්කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් 2016 අප්‍රේල් 30 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571 ප්‍රකාරව තැන්පතු කාල සීමාව වර්ෂ 2 ක් ගත වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කළ යුතු වුවද, 2015 දෙසැම්බර් 31 දිනට එසේ බැර නොකළ තැන්පතු ප්‍රමාණය රු. 29,787,383 ක් විය.

(vi) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් රු.72,021,920 ක් වූ විවිධ තැන්පතු ශේෂය තුල එකතු වටිනාකම රු. 2,315,002 ක් වූ නිකුත් කල නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ මාස 6 ඉක්මවූ චෙක්පත් 374 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු නොකර ආපසු ගෙවිය යුතු විවිධ තැන්පතු ගිණුමට ඇතුලත් කර තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

--------------------

### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

------------------------------------

(i) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2015 තථ්‍ය අයකරගත යුතු | 2015 තථ්‍ය අයකරගත් | 2015 වර්ෂයට හිඟය | 2015 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2014 තථ්‍ය අයකර ගතයුතු | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 364,509 | 200,449 | 164,060 | 344,899 | 339,880 | 334,643 |
| බදු කුලී | 17,299 | 12,894 | 4,405 | 9,874 | 16,973 | 7,622 |
| බලපත්‍ර ගාස්තු | 25,813 | 19,699 | 6,114 | 21,916 | 39,027 | 19,193 |
| වෙනත් ආදායම් | 355,081 | 96,745 | 258,336 | 540,710 | 462,188 | 464,006 |

### 2.3.2 වරිපනම් බදු

-------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද ආදායම් තොරතුරු අනුව සමාලෝචිත මූල්‍ය ප්‍රකාශන අනුව වර්ෂය සඳහා වන වරිපනම් බදු ආදායම රු.355, 679, 879 ක් වුවද, 2015 දෙසැම්බර් 31 දිනට රු. 163,386,678 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ අවසානයට වරිපනම් ණයගැති හිඟ ශේෂය රු.330,731,850 ක් වූ අතර එම ප්‍රමාණයෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.208,518,437 ක් අයවිය යුතුව තිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට පවතින රු. 341,029,868 ක හිඟ වරිපනම් බදු ශේෂය තුළ රු. මිලියනයට වැඩි හිඟ වරිපනම් බදු ශේෂ පවතින ස්ථාන 36 ක් පැවති අතර ඒවායින් අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.69,466,965 ක් විය.

(ඈ) මහා නගර සභා ආඥාපනතේ 240 වගන්තිය ප්‍රකාරව පදිංචි ස්ථානය හා අනෙකුත් හේතුන් සැලකිල්ලට ගෙන 2014 සැප්තැම්බර් 05 දිනැති මහා සභා තීරණ අංක 08(01xඅ) 74 යටතේ රු.11,431,669 ක වරිපනම් බදු මුදලක් කපා හැර තිබුණි. පදිංචියෙන් තොර දේපළ වල වරිපනම් බදු අඩු කිරීමේදී අදාල ස්ථාන පදිංචියෙන් තොර බවට ආදායම් පරීක්ෂකවරුන්ගෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවක් ලබා ගත යුතු වුවත් කොට්ඨාශ 3 කට අයත් වරිපනම් බදු ඒකක 13 ක රු.248,281 ක් වූ වරිපනම් බදු කපා හැරීමේ දි එලෙස ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි.

(ඉ) කොට්ඨාශ අංක 14, පල්ලි දොරපාර අංක 105 දරන දේපළෙහි 2002 වර්ෂයේ සිට 2008 දෙසැම්බර් 31 දක්වා අයකර ගෙන නොතිබුණු රු. 4,380,683 ක හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා 2009 මාර්තු 04 දින අවසාන නිවේදනයක් සභාව විසින් යවා තිබූ අතර ඊට ප්‍රතිචාර

වශයෙන් අදාල ආයතනය 2009 මාර්තු 26 දින වරිපනම් බදු ගෙවීමට නොහැකි බව දන්වා තිබුණි. සභාව විසින් යවා තිබූ අවසාන නිවේදනයට අනුව ඉදිරි කටයුතු සිදුකර නොතිබුණි. එසේ වුවද මේ සම්බන්ධයෙන් 2013 සැප්තැම්බර් 13 දින නාගරික කොමසාරිස් හා නාගරික ගණකාධිකාරී (ආදායම්) විසින් ඉදිරිපත් කර තිබුණු වාර්තාව ප්‍රකාරව "2003 සිට 2009 දක්වා වූ මෙම ආයතනයේ හිඟ වරිපනම් බදු මුදල වූ රු. 3,710,584 ක මුදල අඩුකිරීමකට හෝ කපාහැරීමට නීත්‍යානුකූල ඉඩක් නොමැති බවට" වූ නිර්දේශය නොසලකා හරිමින්, 2014 පෙබරවාරි 07 දිනැති මහා සභා තීරණ අංක 08 (9 ආ ) 01 ප්‍රකාරව මෙම ආයතනය විසින් 2003 සිට 2012 දක්වා ගෙවිය යුතු වරිපනම් බදු මුදලින් 1/5 ක් පමණක් එනම් රු. 886,200 ක්,අයකිරීමටත් ඉතිරි 4/5 මුදල සමානුපාතිකව අඩුකිරීමටත් තීරණය කර තිබුණි.

### 2.3.3 බලපත්‍ර ගාස්තු

(අ) (i) 2014 සැප්තැම්බර් 19 දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ iv (ආ) කොටසෙහි දැක්වෙන පරිදි එහි සඳහන් සියළුම ව්‍යාපාරයන් වාර්ෂික වටිනාකම මත අදාල ගාස්තු ගෙවා වෙළඳ බලපත්‍රයක් ලබාගත යුතු වුවත් 2015 දෙසැම්බර් 31 දින වන විටත් වෙළඳ බලපත්‍ර ලබා නොගත් ව්‍යාපාර ආයතන 1285 ක් පැවතිය ද සභාව විසින් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) සභාව විසින් බලපත්‍ර නිකුත් කිරීමෙන් තොරව බලපත්‍ර ගාස්තුව පමණක් අයකරගෙන ඇති ව්‍යාපාර සංඛ්‍යාව 73 ක් වන අතර බලපත්‍ර නොමැතිව ව්‍යාපාර කටයුතු කිරීම සම්බන්ධයෙන් සභාව විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි.

(ආ) 2000 අංක 53 සහ 1988 අංක 56 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වෙනි වගන්තිය යටතේ පැවැරී ඇති බලතල ප්‍රකාරව එකී පනත යටතේ ස්ථාපිත මධ්‍යම පරිසර අධිකාරිය විසින් 2008 පෙබරවාරි මස සිට පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ බලය නගර සභා වෙත පවරා ඇති අතර සභාව විසින් නිකුත් කරන එම පරිසර බලපත්‍රයක වලංගු කාලය අවුරුදු 3 ක් වේ. කෙසේ වුවද ව්‍යාපාර ආයතන 12 ක් විසින් මෙම බලපත්‍රයේ වලංගු කාලය අවසන් වුවද එය අළුත් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ පිළිබඳව සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) (i) සමාලෝචිත වර්ෂය සඳහා රු.15,000,000 ක් ව්‍යාපාර බදු ආදායම ලෙස ඇස්තමේන්තු කර තිබුණද 2015 සඳහා රු.11,638,580 ක් බිල්කර තිබුණි. එයින් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු. 8,618,830 ක් අයවිය යුතුව තිබුණි.

(ii) 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.16,234,038 ක ව්‍යාපාර බදු ණයගැති ශේෂයෙන් සමාලෝචිත වර්ෂය අවසන් දිනට රු. 12,839,538 ක් අයවිය යුතුව තිබුණි.

### 2.3.4 කසල ගාස්තු

2003 නොවැම්බර් 18 දිනැති අංක 08 (10) 35 දරණ සභා තීරණය හා මුදල් කාරක සභාවේ උපදෙස් පරිදි හිඟ කසල ගාස්තු අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට හිඟ කසල ගාස්තුව රු.3,302,101 ක් වූ අතර සභාව විසින් කසල ඉවත් කරනු ලබන ව්‍යාපාරික ස්ථාන හා සභාව අතර ගිවිසුම් ගත බැඳීමක් ඇති කර ගෙන නොතිබුණු බැවින් හිඟ කසල ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කල නොහැකිව තිබුණි.

**2.3.5 මුද්දර ගාස්තු**

-------------

සමාලෝචිත වර්ෂය සඳහා රු.155,000,000 ක ආදායමක් අයවැයගත කර තිබුණු නමුත් ඉන් කිසිදු මුදලක් වර්ෂය තුළ ලැබී නොතිබුණි. මුද්දර බදු ආදායම් තොරතුරු අදාල රෙජිස්ට්‍රාර් කාර්යාල වෙත ගොස් ලබා නොගැනීම හේතුවෙන් 2015 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර බදු ආදායම පිළිබඳ නිවැරදි තොරතුරු අනාවරණය නොවුණි.

**2.3.6 උසාවි දඩ ආදායම්**

-------------------

සභාව විසින් 2015 වර්ෂය සඳහා උසාවි දඩ ආදායම් ලෙස රු. 22,500,000 ක මුදලක් අයවැයගත කර තිබුණද සමාලෝචිත වසරේ තථ්‍ය ආදායම රු. 100,481 ක් එනම් ඇස්තමේන්තු ආදායමෙන් සියයට 0.4 ක් පමණක් විය. 2012, 2013, 2014 හා 2015 වර්ෂ වෙනුවෙන් ලැබිය යුතුව ඇති රු. 116,173,231 ක් වූ උසාවි දඩ හිඟ ආදායම් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය තුල දී කටයුතු කර නොතිබුණි. 1994 අංක 04 දරන උසාවි දඩ මුදල් හා දඩ පැවරීමේ ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි මෙම දඩ මුදල් අයකරනු ලැබූ වර්ෂයේ දෙසැම්බර් 31 දින සිට වර්ෂ 5 ක් ඇතුළත පමණක් එම දඩමුදල් අයකරනු ලැබූ අධිකරණයේ රෙජිස්ට්‍රාර් විසින් හෝ ඔහු විසින් නම් කරනු ලැබූ නිලධාරියෙකු විසින් සහතික කරන ලද ලේඛන සහිතව ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වුවද එසේ ඉදිරිපත් කර නොතිබුණි.

**2.3.7 කඩබදු**

-------

(අ) කඩ කුලී බදු ගිවිසුම් සම්බන්ධයෙන් සිදු කල නියැදි පරීක්ෂාවේ දී කඩ කාමර 07 ක බදු ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව ව්‍යාපාර කටයුතු කරගෙන ගොස් තිබුණු අතරම කඩ කාමර 05 ක ගිවිසුම් කාලය අවසන් වූ බදු ගිවිසුම් සඳහා නව ගිවිසුම් අත්සන් කිරිම හෝ ඒවා යවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කඩ කාමරවල දිගු කලක සිට අනවසරයෙන් පදිංචි වී සිටි අයවලුන් ඉවත් කිරිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) වෙළඳසැල් හිමියන් සමඟ සභාව ඇතිකර ගන්නා බදු ගිවිසුම් ප්‍රකාරව සභාවේ අනුමැතියකින් තොරව වෙළඳසැල් අතුරු බදු දීම තහනම් වුවද ඇතැම් කඩ කාමර අතුරු බදු දී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කසල බැහැර කිරීම වෙනුවෙන් සභාව සහ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (බස්නාහිර පළාත) අතර පැවති ගිවිසුම 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී ඇති නමුත් 2016 මාර්තු 31 දින වන විටත් මෙම ගිවිසුම යවත්කාලීන කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) කරදියාන අපද්‍රව්‍ය ඒකකයට කසල බැහැර කිරීමේ දී සභාවට අයත් නොවන වාහන වලින් ප්‍රවාහණය කරනු ලැබූ කසල ටොන් 438 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී රු.266,813 ක මුදලක් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට ගෙවා තිබුණි.

**3.2 අවිධිමත් ගනුදෙනු**

------------------

(අ) මාසික මහා සභා රැස්වීමට සහභාගි වන නිලධාරින්ට නිල ඇඳුම් ලබා දීම වෙනුවෙන් 2015 වර්ෂයේ දී රු.235,000 ක් ගෙවා තිබු අතර එම වියදම මහ නගර සභා ආඥා පනතේ 188 (1) " අ" සිට " ඍ " දක්වා වන වියදම් වලින් ආවරණය වී නොතිබුණි.

(ආ) 2012 ජූලි 11 දිනැති අංක ඩබ්.පී/එල්.ජී.ඩී/01/2012 දරන පළාත් පාලන කොමසාරිස්ගේ (බ.ප) චක්‍රලේඛයේ (xiii) වන ඡේදය ප්‍රකාරව පළාත් පාලන ආයතනවල සැලසුම් කමිටුවේ සංයුතිය දක්වා තිබුණද එයට අනුකූල නොවන ලෙස සැලසුම් කමිටුවට සහභාගී වීම වෙනුවෙන් කාර්යාල කාර්ය සහයකයන් සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.184,000 ක් ගෙවා තිබුණි.

**3.3 හඳුනාගත් අලාභ**

-----------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වාගත යුතු වුවද එසේ නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මස සිට දෙසැම්බර් මස දක්වා වරින් වර සභාවේ ජංගම ගිණුමේ රු.102,943 සිට රු. 53,635,988 දක්වා වූ පරාසයක අයිරාවක් පැවතීම හේතුවෙන් රු. 211,792 ක මුදලක් අයිරා පොලී වශයෙන් ගෙවා තිබුණි.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් වල සියයට 01 සිට සියයට 98 ක් දක්වා විචලනයන් පැවතුණු අවස්ථා 17 ක් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

(ආ) වියදම් විෂයන් 66 ක් සඳහා අයවැයගත රු.25,843,000 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඇ) ආදායම් ශීර්ෂ 07 ක් යටතේ ආදායම් විෂයයන් 11 ක අයවැයගත රු.168,575,000 ක ආදායම් වලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් එකතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කිරීමට අපේක්ෂා කළ වැඩසටහන් 04 ක් සඳහා රු.1,260,000 ක මුදලක් ණයහිමියන් ලෙස ප්‍රතිපාදනය කර සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමට එරෙහිව වියදමක් ලෙස දක්වා තිබුණ ද 2016 අප්‍රේල් 30 දින වන විටත් මෙම වැඩසටහන් යටතේ කිසිදු වියදමක් දරා නොතිබුණු අතරම අවශ්‍ය වැඩසටහන් ආරම්භ කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**4.2 නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

**-----------------------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු වාහන 05 ක් මාස 06 සිට මාස 18 දක්වා කාලපරාසයක සිට අළුත් වැඩියා කළයුතු තත්වයේ අක්‍රීයව පැවතුණු අතර 2016 ජුනි 09 දින වන විටත් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2003 වර්ෂයේ මිලදී ගත් රු.65,000 ක් වටිනා මෝටර්සයිකලයක් ද 1999 වර්ෂයේ මිලදී ගත් රු.9,248,274 ක් වටිනා බුල්ඩෝසරයක් ද භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතියද ඒවා අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

**----------------------------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් 07 ක් සඳහා 2016 මැයි 31 වන දින වන විටත් පිළිතුරු / කරුණු පැහැදිලි කර නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනු වල වටිනාකම රු.8,284,031 ක් විය. ඉකුත් වර්ෂ 04 ක කාලය තුළ නිකුත් කළ විගණන විමසුම් වලින් 08 කට ඉහත සඳහන් දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

**---------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය
(ආ) අයවැය පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ණයගැති හා ණයහිමි පාලනය